# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2143/57 - 2019 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2019.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/15/38/2010

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.03.15 දිනැති හා අංක 1749/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළොන්නාව, නිමාව, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, ප්‍රධාන රසායනාගාරයේ හි බී. වී. සමරසිංහ මයා හා කොළොන්නාව, නිමාව, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, ප්‍රධාන රසායනාගාරයේ ඩබ්. කේ. ඩී. සෙනරත් මයා සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො. 609 හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා කොළොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.05.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019, සැප්තැම්බර් මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/38/2010

කාර්මික අධිකරණයේදී ය

01. බී. වී. සමරසිංහ මහතා,
ප්‍රධාන රසායනාගාරය,
සිලෝන් පෙට්‍රෝලියම්
ස්ටෝරේජ් ටර්මිනල්ස්
ලිමිටඩ්,
නිමාව, කොළොන්නාව.

02. ඩබ්. කේ. ඩී. සෙනරත්
මහතා,
සිලෝන් පෙට්‍රෝලියම්
ස්ටෝරේජ් ටර්මිනල්ස්
ලිමිටඩ්,
නිමාව, කොළොන්නාව.
*(ඉල්ලුම්කරුවන්)*

නඩු අංකය : A/3439

01. ලංකා ඛණිජ තෙල් නීතිගත
සංස්ථාව,
නො : 609, දොස්තර
ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

02. සිලෝන් පෙට්‍රෝලියම්
ස්ටෝරේජ් ටර්මිනල්ස්
ලිමිටඩ්,
නිමාව, කොළොන්නාව.

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි.

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට 2012.03.08 වන දින මා වෙත යොමු කොට ඇත.


1A-G 31184 — 31 (2019/10)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනලස් ලිමිටඩ් (මෙහි මින් මතු CPSTL ලෙස හැඳින්වෙන) ආයතනයේ සේවයේ නියුතු බී.වී. සමරසිංහ හා ඩබ්.කේ.ඩී. සෙනරත් යන මහතුන්ට ලබා දෙන ලද උසස්වීම් ඒ අයුරින්ම ලබා නොදී කප්පාදු කිරීම, ඔවුන්ගේ තනතුරු පිරිස් බල සැලැස්මට ඇතුලත් නොකිරීම සහ ඔවුන් දෙදෙනා අවශ්‍ය සුදුසුකම් සපුරා අදාළ විභාග සමත්ව සිටිය දී තාක්ෂණික සේවයට ඇතුළත් නොකිරීම යන කරුණු මත මොවුන්ගේ සේවා වරප්‍රසාද හා ලැබිය යුතු නිසි වැටුප් අහිමි වී අගතියක් සිදු වූයේ ද? එසේ අගතියක් සිදු වූයේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද යන්නයි.

කාර්මික ආරවුල් පනතේ 21(1) නියෝග ප්‍රකාරව දෙපාර්ශ්වයේම සවිස්තරාත්මක ප්‍රකාශ දූන්වීමෙන් අනතුරුව පිළිතුරු ප්‍රකාශ හුවමාරු කරවා ගෙන සමථයක් සඳහා ඉඩකඩ ලබා දුන් පසුව සමථයක් නොමැති බැවින් ඒ බව වාර්තා කොට, ඉන් අනතුරුව මෙම ආරවුල විමසුමට ගන්නා ලදී.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරුවන් දෙදෙනා සාක්ෂි ලබා දෙමින් A1 සිට A28 දක්වා ලේඛන ලකුණු කරමින්ද 1වන වගඋත්තරකරු වෙනුවෙන් එක් සාක්ෂිකරුවෙකු සාක්ෂි ලබා දෙමින් R1 සිට R9 දක්වා ලේඛන සහ 1R10 සිට 1R29 දක්වා වූ ලේඛන ලකුණු කරමින්ද දෙවන වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂිකරුවන් තිදෙනෙකු සාක්ෂි ලබා දෙමින් R1 සිට R38 දක්වා වූ ලේඛනද ලකුණු කරමින් තම තමන්ගේ නඩු අවසන් කර ඇත.

කාර්මික අධිකරණ හා බේරුම්කරණ අධිකරණ බලය ලබා ගන්නේ විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි. මෙකී යොමුව අධ්‍යනය කිරීමේ දී යොමුවේ ප්‍රධාන කොටස් 2ක් හඳුනා ගත හැකිය.

i CPSTL ආයතනයේ සේවයේ නියුතු බී.වී. සමරසිංහ හා ඩබ්.කේ. සෙනරත් යන මහතුන්ට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ (මෙහි මින්මතු CPC ලෙස හැඳින්වෙන) දේශපාලන පළිගැනීම් කමිටුවෙන් ලබා දෙන ලද උසස්වීම් ඒ අයුරින්ම ලබා නොදී කප්පාදු කිරීම, ඔවුන්ගේ තනතුරු පිරිස් බල සැළැස්මට ඇතුළත් නොකිරීම සහ ඔවුන් දෙදෙනා අවශ්‍ය සුදුසුකම් සපුරා අදාළ විභාග සමත්ව සිටියදී තාක්ෂණික සේවයට ඇතුළත් නොකිරීම යන කරුණුමත මොවුන්ගේ සේවා වරප්‍රසාද හා ලැබිය යුතු නිසි වැටුප් අහිමි වී අගතියක් සිදු වූයේ ද?

ii එසේ අගතියක් සිදු වූයේ නම් ඔවුන්ට ලැබිය යුතු සහන කවරේද යන්නයි.

ඊට අමතර වශයෙන් 1වන වගඋත්තරකරු තවදුරටත් ඉල්ලුම්කරුවන්ගේ සේවායෝජකයා නොවන බවත් එහි වගකීම දෙවන වගඋත්තරකරු භාරගන්නා බවත් ප්‍රකාශ කළ අතර, 1වන වගඋත්තරකරු මුදා හැරීමට ඉල්ලීමක් කරන ලදී. නමුත් ඉල්ලුම් කරුවන් විරුද්ධ වූ නිසාවෙන් දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කිරීමට අවස්ථාව සලසා දුන් අතර ඒ සම්බන්ධයෙන් විමසීම අවසානයේ ඉල්ලුම්කරුවන් සේවායෝජකයා කවුරුන්ද යන්නත් වගකීම දැරිය යුත්තේ කවුරුන්ද යන්නත් තීරණය කරනු ලබන බවට නියෝගයක් ලබා දී ඇත.

ඒ අනුව තවත් විසඳිය යුතු ප්‍රශ්න 2ක් පැන නගියි.

i ඉල්ලුම්කරුවන්ගේ සැබෑ සේවා යෝජකයා කවුරුන්ද?

ii මෙහි කාර්මික ආරවුල සම්බන්ධයෙන් වගකීම දැරිය යුත්තේ කවුරුන්ද?

මෙහිදී විශේෂයෙන්ම ඉල්ලුම්කරුවන්ගේ ස්ථාවරය වන්නේ තමන් තාක්ෂණික ශ්‍රේණියකට අදාළ රාජකාරි ඉටු කළ ද ඊට අදාළ තනතුරක් හෝ වැටුප් නොලැබෙන බවයි.

මෙකී දුක්ගැනවිල්ල ඉල්ලුම්කරුවන් දේශපාලන පළිගැනීම් කමිටුව ඉල්ලීම් කිරීමෙන් පසුව C5 රසායනාගාර සහයක තනතුරේ සිට B4 රසායනාගාර සහයක තනතුරට උසස් කොට ඇත. ඒ කෙසේ වුවද ඉල්ලුම්කරුවන් කියා සිටින්නේ දේශපාලන පළිගැනීම් කමිටුවෙන් තමන්ට ලබා දුන්න නිසි තනතුරු පසුව ටිපෙක්ස් යොදා වෙනස් කොට ඇති බවයි. (A5 ලේඛනයේ A5A) ලේඛනය බැලූ බැල්මට ටිපෙක්ස් යොදා වෙනස් කරන ලද බව පෙනී යයි. නමුදු ඒ වෙනස් කිරීමට ප්‍රථම එතැන වෙනත් තනතුරු නාමයන් පැතියේද යන්න හෝ මෙම තනතුරු යතුරු ලියනය කිරීමේදී අක්ෂර වින්‍යාසය වැරදුන නිසා ටිපෙක්ස් කළේද යන්න සොයා ගත නොහැක.

නමුදු දෙවන වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබා දුන් රසායනාගාර කළමනාකාර කෝසලා නිශාන්ති රත්නායක මහත්මිය දේශපාලන පළිගැනීම් කමිටුව ලබා දුන් තනතුරු වැරදි බවට සාක්ෂි ලබාදෙයි. (2015.12.09 සාක්ෂි සටහන් පිටුව 4, 5 පිළිතුර). එදිනම ඇය ලබාදුන් සාක්ෂි පිටුව 23, 1 වන ප්‍රශ්නය.

ප්‍ර : සමාගමෙන් කිසියම් කෙනෙක් සහභාගි වුණා නේද නියෝජිත මහත්මයෙක් ඔහු කියලා තියෙනවාද මේ දීලා තියෙන්නේ නිවැරදි පත්වීම් කියලා?

උ : ඔව්

ප්‍ර : එතකොට මේ මහත්තයාට විරුද්ධ වෙන්න තිබුණා නේද?

උ : ඒ තනතුරු ගැන මම දන්නේ නැහැ. ඔහු ඒ තනතුරු ගැන අවබෝධයකින් තමයි යන්න ඕනෑ.

ප්‍ර : නමුත් එහෙම කෙරිලා නැහැ?

උ : කෙරුණා නම් මෙහෙම වෙන්නේ නැහැනේ.

ඉල්ලුම්කාර කේ.ඩී. සෙනරත් මහතා තමන්ට දෙන ලද උසස් වීම් ලිපිය ආපසු ඉල්ලා ගෙන පසුව වෙනස් කරන ලද ලිපිය ලබා දුන් බවට සාක්ෂි දෙයි.

මේ අනුව ඉල්ලුම්කරුවන් ප්‍රකාශ කරන ආකාරයට ටිපෙක්ස් යොදා දේශපාලන පළිගැනීම් කමිටුව ලබා දුන් තනතුර පසුව වෙනස් කළේ දැයි යන සැකය මතු වෙයි. මන්ද දැනට තාක්ෂණික අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන රසායනාගාර කළමණාකාරිනියගේ මුවින් පිට වනුයේ දේශපාලන පළිගැනීම් කමිටුව ලබා දුන් තනතුර වැරදි බවයි.

එම නිසා තමුන්ලා ටිපෙක්ස් යොදා එහි තනතුර තමුන් සිතන ආකාරයට නිවැරදි කළා නේද? යන දැඩි ස්ථාවරයෙන් සෘජුව

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා නැති නමුත් අදාළ ලිපිය යතුරු ලියනය කරන ලද තැනැත්තා හෝ ලිපියට අත්සන් කරනු ලැබූ තැනැත්තා හෝ සාක්ෂියට කුමන පාර්ශවයක් විසින් හෝ කැඳවූයේ නම් සත්‍ය වශයෙන්ම සිදු වූයේ කුමක්දැයි හෙළිදරව් වීමට තිබුණි.

මේ කිසිදු කරුණක් සිදු නොවූ නිසා අනුමානයක් වුව ඇති කර ගැනීම අසීරුය නැගිය හැක්කේ යම් සැකයක් පමණි.

මේ අතරතුර සාක්ෂි දෙමින් රසායනාගාර කළමණාකාරතුමිය තාක්ෂණික ශ්‍රේණියට හා තාක්ෂණික නොවන ශ්‍රේණියට අදාළ තනතුරු ප්‍රකාශ කොට ඇත. 2015.12.19 සාක්ෂි සටහන් පිටුව 4.

ප්‍ර : තාක්ෂණික ශ්‍රේණිවලට අදාළ තනතුරු මොනවාද?
උ : කළමණාකාර රසායනාගාර, නියෝජ්‍ය කළමණාකාර රසායනාගාර, රසඥ ජ්‍යෙෂ්ඨ විශ්ලේෂක, රසායනාගාර සහකාර.
ප්‍ර : තාක්ෂණික නොවන ශ්‍රේණිවල තනතුරු මොනවාද?
උ : ලිපිකරු, පරිගණක ක්‍රියාකරු, විශේෂ සහයක, සාමාන්‍ය කම්කරු.

දේශපාලන පලිගැනීම් කමිටුවෙන් ලබා දී ඇති (දැනට තිබෙන) තනතුරුද වැරදි බවත් එය පිරිස් බල සැකැස්මට අයත් නොවන බවත් දෙවන වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂි දෙයි. එසේම 2වන වගඋත්තරකරු වෙනුවෙන් නිළධාරීන් මෙම කමිටුව නියෝජනය කළ බවත් පිළිගනී. එසේ නම් ඔහුම පිළිගන්නා පරිදි එම නිලධාරීන් වැරදි තනතුරක් ලබා දෙන තුරු නිහඬව සිටියේ මන්ද? යන අතුරු ප්‍රශ්නය පැන නගී.

එකී නිලධාරීන් මෙම කමිටුවට පත් කරනු ලබන්නේ යම් යම් තාක්ෂණික දෝෂ ඇතිවීම වළක්වාලීමත් සත්‍ය කරුණු අනාවරණය කර ගැනීමේ පූර්ණ අභිලාෂයෙනි. එසේ නම් එම නිළධාරීන්ගේ වගකීම සහ කාර්ය භාරය කුමක් වී ද ඃ එකී නිලධාරීන් මුලින් එකඟ වූ නිසාවෙන් පසුව එසේ නොවේ යයි කීමෙන් එය ප්‍රතික්ෂේප කළ නොහැකිව ප්‍රතිබන්ධනය (Estople) වී ඇත්ද ඃ වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 20 වන දිනැති සාක්ෂි සටහන් පිටුව 4,5 හා 6 හි පිරිස් කළමණාකරණ අසංග (CPSTL ආයතනය වෙනුවෙන් කමිටුවේ සිටි බවට සාක්ෂි ලබා දී ඇත.

තනතුරු නාමයන් ටිපෙක්ස් කිරීම නිසා යම් සැකයක් ඇති වූයේ නම් එය නිවැරදි කිරීමට වැඩි අවස්ථාවක් තිබුණේ වගඋත්තරකරුවන්ටය. තවද මෙම ප්‍රශ්නය ඇති කරනු ලැබුවේ වගඋත්තරකරුවන්ය. එම නිසා එය නිවැරදි කළ යුත්තේ ද ඔවුන්ය. ලංකාවේ ප්‍රධානම සංස්ථාවක සේවකයන්ට නිකුත් කරනු ලබන උසස්වීමක් ලබා දෙන්නේ ටිපෙක්ස් යොදා වෙනස් කර ඒ මත නැවත යතුරු ලියනය කිරීමෙන් දැයි ප්‍රශ්නයක් මතු කළ හැකි ය. වෙනත් අතකින් සේවකයන් දෙදෙනාගේම ලිපි ටිපෙක්ස් කිරීම තුළ එතැන වෙනත් තනතුරු නාමයක්/තනතුරු නාමයක කොටසක් හෝ පැවතිය යුතු බවට තර්කයක් ගොඩ නැගිය හැක. මන්ද එකම ආකාරයෙන් අවස්ථා 2 කදීම වැරදීමට ඇති හැකියාව අඩුය.

මොහොතකට වැරදුනා යැයි සිතුව හොත් කළ යුතුව තිබුණේ එම ලිපි 2 ඉවත් කොට වෙනත් නිසි අයුරින් සකස් කරන ලද ලිපි 2 ක් ලබා දීමයි. මන්ද සේවකයෙකුගේ රාජකාරි ජීවිතයේ වැදගත්ම දෙය තම තනතුරයි/උසස්වීමයි. ඒ වැනි ලේඛනයක් ප්‍රධානතම සංස්ථාවක ලබා දෙන්නේ මෙසේ දැයි දීර්ඝ ප්‍රශ්නාර්ථයක් පැන නගී.

සේවකයන් දෙදෙනා ප්‍රශ්න කරන නිසාවෙන් හෝ වග උත්තරකරුවන්ට කළ යුතුව තිබුණේ දේශපාලන පළිගැනීම් කමිටුවේ සම්පූර්ණ නිර්දේශය අඩංගු ලියවිල්ල ඉදිරිපත් කරවීමට සැළැස්වීමයි. අඩුම තරමින් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව වැනි යමක් හෝ ඉදිරිපත් කිරීමට පියවර ගත්තේ නම් මෙසේ සේවකයන් දෙදෙනාට සැක මතු කළ නොහැක. සැම විටම කාලය නාස්ති කරමින් වෙනත් දේ පසුපස ගියා මිස සුදුසුම දෙය කිරීමට වගඋත්තරකරු ක්‍රියා කළේ නැත. නැතිනම් එසේ ක්‍රියා කිරීමේ නොහැකියාවක් වී ද? එසේම මේ ආකාරයෙන් අසාධාරණයට පත් වූ සේවකයන් 19 දෙනෙකු අභියාචනාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කර සහන ලබා ගෙන ඇත. C.A.(Writ) 654/2008 එකී නඩුව/තීන්දු මෙම ඉල්ලුම්කරුවන්ට අදාළ නොවන බව වගඋත්තරකරුවන් පැවසුවත් එය අදාළ නොවන්නේ කුමන කරුණක් නිසා දැයි ප්‍රකාශ කිරීමට අපොහොසත් වී ඇත. නමුත් එය බැලූ බැල්මට CPC එරෙහිව නඩුවකි. CPC හා CPSTL සඳහා දේශපාලන පලිගැනීම් කමිටුවක් පැවති නමුත් වෙන වෙන ලැයිස්තු 2 ක් සකස් කළ බවට සාක්ෂි ලබා දී ඇත. (2018.02.21 සාක්ෂි සටහන් පිටුව 5, 6 හා 7) සත්‍ය වශයෙන් මෙම ඉල්ලුම්කරුවන් එකී නඩුවේ පාර්ශ්වයන් නොවූ නිසා එම සහන මොවුන් නීත්‍යානුකූලව හිමි නොවූ නමුදු එකී සඳහන් ආකාරයෙන් එකී සේවකයන්ට අසාධාරණයක් සිදු වූයේ නම් ඒ හා සමානව අසාධාරණයට ලක් වූ අනෙක් සේවකයන්ටද සාධාරණය ඉටු කිරීමට වගකිව යුතු ආයතනයක වගකීම නොවන්නේ ද? මන්ද මෙම සේවකයන්ද තමන්ට අසාධාරණයක් වූ බව ආයතනයේ බලධාරීන්ට දන්වා ඉල්ලීම් කිරීමෙන් අනතුරුව එය ඉටු නොවූ විට කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. ඒ අනුව ඔවුන් තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවධියෙන් සිට ඉල්ලීම් කොට ඇති බව තහවුරු වෙයි.

ඒ කෙසේ වෙතත් ඉල්ලුම්කරුවන් පිළිනොගන්නේ වුවද ලබා දුන් තනතුරු පිරිස් බල සැකැස්මට ඇතුළත් නොකිරීම තුළින් වගඋත්තරකරුවන්ගේ සද්භාවය නැවත ප්‍රශ්න කරයි. මෙම ප්‍රශ්නය විසඳීමට ඔවුනට සැබෑ වුවමනාවක් වීද යන ප්‍රශ්නය ඉතිරි කරයි. ඔවුන් වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිඩනය කළ කල්හී මේ බව විද්‍යාමාන වෙයි.

මෙම විමසුමට ඉදිරිපත්ව ඇති ලේඛන සහ සාක්ෂි විමසිල්ලෙන් බැලූ කල්හි මේ අනුව සමස්ථ ක්‍රියාවලිය පුරාම මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාට,

01. දේශපාලන පලිගැනීම් කමිටුවෙන් ලබා දුන් උසස්වීම් පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් නිර්මාණය කිරීමෙන් ද,
02. ලබා දුන්නා යැයි කියනු ලබන උසස්වීම් පිරිස් බල සැකැස්මට ඇතුළත් නොකිරීමෙන් ද අසාධාරණයක් සිදු වී ඇති බවට තීරණය කරමි.

එසේ නම් එය නිවැරදි කළ යුතු වන්නේ කෙසේ දැයි ඊළඟට සළකා බැලිය යුතු ය.

මුලින් සඳහන් කළ පරිදි දේශපාලන පළිගැනීම් කමිටුව ඉදිරිපත් කළ සම්පූර්ණ නිර්දේශ අඩංගු ලියවිල්ල වැනි ලේඛනයක් නොපවතින නිසා සත්‍ය වශයෙන් ම මෙම ඉල්ලුම්කරුවන්ට පිරිනැමූ තනතුරු ගැන අනාවරණය කර ගත නොහැක. ඉල්ලුම්කරුවන් පිළිගත්තත් නැති වුවත් වගඋත්තරකරුවන් ලබා දී තිබෙන්නේ B4 රසායනාගාර සහායක ශ්‍රේණියයි. නමුත් ඉල්ලුම්කරුවන් දෙදෙනා පවසන්නේ B4 විශ්ලේෂණ විශේෂ ශ්‍රේණිය මුල් නිවැරදි පත්වීම් ලිපිවල ලබා දී තිබූ බවයි. මේ කාරණා මෙසේ තිබිය දී වර්ෂ 2007.01.15 දිනැති අභ්‍යන්තර පත්‍රිකාවකින් දක්වා ඇති පරිදි B3 රසායනාගාර සහකාර පරීක්ෂණයට ඉල්ලුම්කරුවන් මුහුණ දී ඉන් සමත් වී ඇත. (2013.05.13 පිටුව 13/14 හා R1 ලේඛනය) මෙහිදී එක් විශේෂ කාරණයක් අවධානයට යොමු කළ යුතුව ඇත. වගඋත්තරකරුවන් වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සියළු දෙනාටම පාහේ දේශපාලන පළිගැනීම් කමිටුවට ඉල්ලීම් ඉදිරිපත් කොට ඉල්ලීම් කළ තනතුරු ලබා ගත්ත වුවත් වීමය. ඒ අනුව සැලකිය යුතු පිරිසකට සාධාරණය ඉටු වී ඇති බව පෙනේ.

එසේම මෙම විමසුම පුරාම පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සහ ලබා දෙන ලද සාක්ෂි සම්පීඩණය කරන ලද කල්හි බැස ගත හැකි නිගමනය කුමක් වන්නේ ද යන්න ඊළඟට ඇති වැදගත්ම ප්‍රශ්නයයි. ඒ සම්බන්ධයෙන්,

<u>Ceylon estate staft vs supted of mramore estate.</u>

The president of a labour tribunal should make a proper evalution and consideration of the totality of the evidence before arriving at a conclusion.

වැදගත්ය. එසේම,

<u>Lewis Brown 7 Co.LTD Vs percy Nelson</u>

<u>christoper periypperuma 81 CLW 30.</u>

That the order of the tribunal is not just and equitable order if it is made without examination and consideration of all relevant evidence adduced at the inquiry හි දක්වා ඇති පරිදි ප්‍රදානය ලබා දීමේදී සියළු සාක්ෂි සලකා බැලීම අනිවාර්ය වේ.

මොවුන් රාජකාරි කර ඇත්තේ රසායනාගාරයේය. රසායනාගාරයේ ප්‍රධානියා, ප්‍රධාන රසඥය මොවුන්ගේ වගකීම් හා රාජකාරි ගැන හොඳින්ම දන්නේ ප්‍රධාන රසඥය. ඔහු මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා තාක්ෂණික ශ්‍රේණියට අනුයුක්ත කිරීමට නිර්දේශ කරමින් ඒ බව පිරිස් කළමණාකරුට දන්වා යවා ඇත. (A3)

එසේම මෙම සේවකයන් දෙදෙනා තාක්ෂණික සේවයට අනුයුක්ත කිරිම සඳහා පැවැත්වූ ලිඛිත පරීක්ෂණයකින් සමත්ව ඇත. ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා නැති බව පෙනී යයි. ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් වෙනුවෙන් දීර්ඝව ප්‍රශ්න කළද එසේ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්විය යුතු නම් එසේ නොපැවැත්වීම ඉල්ලුම්කරුවන්ගේ වරදක් නොවේ. එසේම ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍යතාවයක් ඇති බවට සාක්ෂි ලබා දුන් රසායනාගාර කළමණාකාර කෝසලා නිශාන්ති රත්නායක මහත්මිය ප්‍රකාශ කරන්නේ ද නැත.

2018.12.19 දින සාක්ෂි සටහන් පිටුව 7.

ප්‍ර : තාක්ෂණික ශ්‍රේණියට ඇතුලත් කිරීමේ යම් කිසි වෘත්තීමය පරීක්ෂණයක් ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනවාද ?
උ : ප්‍රායෝගික දේවල් පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් සිදු කරන්නේ.
ප්‍ර : තාක්ෂණික සේවයේ තනතුරු ප්‍රදානය කරන්නේ ඒ ආකාරයෙන්?
උ : ඔව්.

තවද A14 ලෙස සලකුණු කොට ඉදිරිපත් කර ඇති ලේඛනය මඟින් ප්‍රධාන රසඥ විසින් ඉල්ලුම්කරුවන්ගේ තනතුරු නාමය කාර්මික තනතුරු නාමයක් වශයෙන් සංශෝධනය කරන මෙන් ඉල්ලා ඇත.

දේශපාලන පළිගැනීම් කමිටුවෙන් ඉල්ලුම්කරුට පක්ෂව ලබා දුන් තීරණය සම්බන්ධව නිශ්චිතව තීරණය කළ නොහැකි මෙම අවස්ථාවේ දී ඉල්ලුම්කරුවන් දෙදෙනාටම කුමන සහනයක් ලබා දෙන්නේද යන ප්‍රශ්නය ඉතිරි කරයි. ඒ අනුව මෙම ඉල්ලුම්කරුවන්ට තාක්ෂණික සේවය ලබා දීම සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රධානියාගේ ඉල්ලීමක් තිබුණු බවත් ඒ සම්බන්ධ අවබෝධයක් සහ අවශ්‍යතාවක් තිබූ නිලධාරියා විසින් ඒ සඳහා කටයුතු කර තිබූ බවත් සාක්ෂි මඟින් තහවුරු වී ඇත. ඒ අනුව සෑම විටම සාධාරණ හෝ යුක්ති සහගත තීරණයක් ලබා දීමට බැඳී සිටින බේරුම්කරණ ක්‍රියාවලියේදී/කාර්මික අධිකරණයේ දී එළඹිය හැකි සාධාරණ හෝ යුක්ති සහගත තීරණය වනුයේ ඔවුන් පරීක්ෂණය සමත්ව ඉල්ලා ඇති තනතුරු ලබා දීමයි.

ඒ අනුව ඉල්ලුම්කරුවන් දෙදෙනා ඉල්ලා ඇති පරිදි, ප්‍රධාන රසඥ නිර්දේශ කළ පරිදි 2007.02.12 දින සිට B3 රසායනාගාර සහකාර තනතුර හා ශ්‍රේණිය ලබා දීමට නිර්දේශ කරමි. මෙම තනතුර තාක්ෂණික සේවයේ තනතුරකි. මෙකී තනතුරු පිරිස් බල සැලැස්මේ දැනටමත් තිබෙන තනතුරක් නිසා නැවත පිරිස් බල සැලැස්මට ඇතුළත් කිරීමට අවශ්‍ය වන්නේ නැත. මොවුන් ඇතුළත් කර ගත හැකි වන පරිදි අවශ්‍ය වන්නේ නම් තනතුරු සංඛ්‍යාව (carder positions) පමණක් වැඩි කර ගැනීම කළ යුතු ය. එය පිරිස් බල සැකැස්මට අළුත් තනතුරක් ඇතුළත් කිරීමට වඩා පහසුවෙන් කර ගත හැකි වනු ඇත.

එසේම මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාට වර්ෂ 2007.02.12 දින සිට ඔවුනට හිමි උසස්වීම් ද, ප්‍රතිලාභයන්ද ලබා දිය යුතු බව තීන්දු කරමි. එසේම පළවන ඉල්ලුම්කාර බී. ඩබ්. සමරසිංහ මහතා විශ්‍රාම ගොස් ඇති බැවින් ඔහුට ද විශ්‍රාම ගිය දින දක්වා හිමි උසස්වීම් හා මූල්‍ය ප්‍රතිලාභයන්ද, විශ්‍රාම ප්‍රතිලාභයන්ද ඒ අනුව ගණනය කළ යුතු බවට තීන්දු කර නියම කරමි.

ඊළඟට විසඳිය යුතු ප්‍රශ්නය වන්නේ මෙම ඉල්ලුම්කරුවන්ට ලබා දිය යුතු සහන ලබා දීමේ වගකීම සතු වන්නේ වගඋත්තරකරුවන් අතරින් කවුරුන්ටද යන්නයි.

මෙම බේරුම්කරණයේ විමසුම ආරම්භ කිරීමට ප්‍රථම CPSTL ආයතනය විසින් මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා ඔවුන්ගේ සේවකයන් බවත් CPC ආයතනයට ඔවුන්ගේ වගකීමක් නොමැති බවටත් වාර්තා ගත කරන ලදී.

එසේම විමසුමේදී ඉදිරිපත් කර ඇති ලේඛන අනුවත් සාක්ෂි අනුවත් ඉල්ලුම්කරුවන් දෙදෙනා CPSTL ආයතනයේ සේවකයින් බවට තහවුරු වී ඇත. විශේෂයෙන් ම CPC ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් නිළධාරී ප්‍රියන්ත පුෂ්පකුමාර වැලිකළ මහතා ලබා දුන් සාක්ෂියෙන් ඒ බව තහවුරු කර ඇත. (2018.02.21 සාක්ෂි සටහන් පිටුව 2, 3 හා 4)

තවද දෙවන වගඋත්තරකරුගේ සාක්ෂිකරුවන්ද මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා ඔවුන්ගේ සේවකයන් බවට පිළිගෙන ඇත. (2017.09.27 සාක්ෂි සටහන් පිටුව 2 හා 3, 4. 5, 6)

එසේම දේශපාලන පළිගැනීම් කමිටුව හා සම්බන්ධ තීරණය ක්‍රියාත්මක කිරීමේ වගකීමද 2 වන වග උත්තරකරුට ඇති බවට සාක්ෂි ලබා දී ඇත. (2018.02.21) සාක්ෂි සටහන් පිටු 5, 6, 7)

ඒ අනුව CPC ආයතනය වෙත වගකීමක් නොපැවරෙන බවට තිරණය කරමි.

ඉල්ලුම්කරුවන් දෙදෙනාට හිමි විය යුතු සියලු සහනයන් CPSTL ආයතනය විසින් ලබා දිය යුතු බවට තීරණය කරමි.

ඒ අනුව CPSTL ආයතනය විසින්,

I. ඉල්ලුම්කරුවන් දෙදෙනාට වර්ෂ 2007.02.12 දින සිට B3 ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුර සහ ශ්‍රේණියද,

II. B3 රසායනාගාර සහකාර තනතුරට අදාළ සියලු නීත්‍යානුකූල වරප්‍රසාදයන්ද,

III. 2007.02.12 දින සිට 1 වන ඉල්ලුම්කරුට විශ්‍රාම ගිය දිනය දක්වාද හිමි උසස්වීමද, වැටුප් වර්ධකයන්ද, දීමනාද හිඟ වැටුප්ද, විශ්‍රාම ප්‍රතිලාභයන්ද,

IV. 2007.02.12 දින සිට 2 වන ඉල්ලුම්කරුට මෙම ප්‍රදානය ක්‍රියාත්මක වන දිනය දක්වා සියළු උසස්වීම්, වැටුප් වර්ධක දීමනා ඇතුළත්ව හිඟ වැටුප්ද ගෙවිය යුතු බවට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට තහවුරු කරමි. මෙය ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

බේරුම්කරු
සුනෙත් ලොකුබෝගහවත්ත.

2019 මැයි මස 21 වැනි දින.

10 - 679

*මගේ අංකය* : IR/22/22/2011

## කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.08.15 දිනැති හා අංක 1823/60 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.07.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අනුරාධපුර, අග්බෝපුර, දෙවන පියවර, තුන්වන පටුමඟ, අංක 529/27 හි පදිංචි කේ. ප්‍රේමරත්න මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.05.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### කාර්මික අධිකරණයේ දී ය

කේ. ප්‍රේමරත්න මහතා,
අංක 529/27,
තුන්වන පටුමඟ,
අග්බෝපුර - II පියවර,
අනුරාධපුරය.

බේරුම්කරණ අංකය : 3515
IR/22/22/2011

*ඉල්ලුම්කරුවන්*

*සහ*

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.
ගාඩිනර් මාවත,
කොළඹ 02.

*වගඋත්තරකරු*

### ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ ගරු අමාත්‍යතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2013.07.11 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර කාර්මික ආරවුලට හේතු වී

පවත්නා කරුණ වනුයේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ K4 හා K3 ශ්‍රේණිවල වසර පහළොවකට (15) අධික සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මානව සම්පත් නිලධාරී ලෙස සේවය කළ කේ. ප්‍රේමරත්න මහතාට 2005.01.01 දින සිට K2 ශ්‍රේණියේ නොපිහිටුවීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ වන්නේ නම් ඉහත දින සිට එම K2 ශ්‍රේණියේ පිහිටුවා ඔහුට හිමි විය යුතු දීමනා ලබා ගැනීමට මූල්‍යමය හිමිකම් තිබේ ද ? නැතහොත් වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

මෙම කාර්මික ආරවුල කාර්මික ආරවුල් පනතේ 21(1) නියෝග ප්‍රකාරව දෙපාර්ශවයේ විස්තරාත්මක ප්‍රකාශය දැන්වීමෙන් පසුව පිළිතුරු ප්‍රකාශය හුවමාරු කරවා ගෙන සමථයක් සඳහා ඉඩකඩ ලබාදුන් පසුව සමථයක් නොමැති බැවින් ඒ බව වාර්තා කොට ඉන් අනතුරුව විමසුමට ගන්නා ලදී.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සාක්ෂි ලබා දෙමින් ඒ1 සිට ඒ21 දක්වා ලේඛන ලකුණු කරමින් සිය නඩුව අවසාන කොට ලිඛිත දේශන ඉදිරිපත් කොට ඇත.

වගඋත්තරකරු වෙනුවෙන් මානව සම්පත් නිලධාරිණි රත්නායක මුදියන්සේලාගේ මංජුලා ප්‍රියදර්ශනී රත්නායක සාක්ෂි ලබා දෙමින් ආර්1 සිට ආර්5 දක්වා ලේඛන ලකුණු කරමින් සිය නඩුව අවසන් කොට ඇත.

බේරුම්කරු අධිකරණ බලය ලබා ගන්නේ විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙන් යොමුව අධ්‍යනය කිරීමේදී ප්‍රධාන කොටස් 2ක් හඳුනා ගත හැකිය.

(i) ලංකා විදුලිබල මණ්ඩලයේ K4 හා K3 ශ්‍රේණිවල වසර පහළොවකට (15) අධික සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මානව සම්පත් නිලධාරී ලෙස සේවය කළ කේ. ප්‍රේමරත්න මහතාට 2005.01.01 දින සිට K2 ශ්‍රේණියේ නොපිහිටුවීම තුළින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද ?

(ii) එසේ වන්නේ නම් 2005.01.01 දින සිට K2 ශ්‍රේණියේ පිහිටුවා ඔහුට හිමි විය යුතු දීමනා ලබා ගැනීමට මූල්‍ය හිමිකමක් තිබේද ?

නැතහොත් වෙනත් සහනයන් මොනවාද යන්න වේ.

ඉල්ලුම්කාර කේ. ප්‍රේමරත්න මහතා 1971.04.28 වැනි දින ලිපිකරුවෙකු වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ පත්වීම් ලබා ඇත. ඉන්පසු සංඛ්‍යා ලේඛන ගණන් ගන්නා නිලධාරී තනතුර ද, ගිණුම් සහකාර තනතුර ද ලබා ඇත. මණ්ඩලීය නිවේදනයක් අනුව මණ්ඩලයේ පාලන සහකාර පුරප්පාඩු, සඳහා අයදුම්පතක් යොමු කර ඇත. පාලන සහකාර තනතුර සඳහා අයදුම්කරුවන් 80 දෙනෙකු ඉල්ලුම්කර ඇති අතර ඒ අතුරින් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අතර ප්‍රේමරත්න මහතා ද ලකුණු 65ක් ලබා ගනිමින් 7 වෙනියා ලෙස තේරී ඇත. (ඒ2) එහෙත් අනෙක් අයට පාලන සහකාර තනතුරු ලබා දී ඇතත් පැමිණිලිකාර ප්‍රේමරත්න මහතාට ක්‍රියාකාරී අධ්‍යක්ෂකතුමාගේ බලපෑම් මත පාලන සහකාර තනතුර ලබා දී නැත. ඉන්පසු ඒ මහතා ගිණුම් සහකාර තනතුර සඳහා පැවති තරඟකාරී විභාගයෙන් දෙවැනි තැනට පත් වී (60 දෙනෙකු අතරින්) එම තනතුරේ සේවය කරන ලදී. සිදු වී ඇති අසාධාරණයන් සොයා බැලීම පිළිබඳ අමාත්‍යාංශ මට්ටමේ පත් කළ කමිටුව වෙත පැමිණිලිකාර කේ. ප්‍රේමරත්න මහතා විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. අසාධාරණය පිළිබඳව පරීක්ෂා කිරීමෙන් පසුව 1999.12.24 වැනි දින පැවති අමාත්‍යාංශ රැස්වීමේදී එළඹී තීරණවලට අනුව ඒ මහතාට සිදුව තිබූ අසාධාරණ පහත සඳහන් පරිදි හිඟ වැටුප් හිඟ දීමනා ගෙවා නිවැරදි කරන ලදී (ඒ2).

ඒ අනුව 1983.10.03 පාලන සහකාර K5 වැටුප් පරිමාණය (ඒ2බී)
1989.10.03 පාලන නිලධාරි K4 වැටුප් පරිමාණය (ඒ2සී)
2000.04.26 පිරිස් නිලධාරි K3 වැටුප් පරිමාණය (ඒ2ඩී)

පැමිණිලිකාර කේ. ප්‍රේමරත්න මහතාට සිදු කර තිබූ අසාධාරණය නිවැරදි කර 1983.10.03 වැනි දින සිට හිඟ වැටුප් හිඟ දීමනා වෙනත් සියලු වරප්‍රසාද ලබා දෙන ලදී. (ඒ2ඒ) තවද, 2000.04.26 වැනි දිනට පිරිස් නිලධාරි තනතුර ලබාදීම අසාධාරණ බවත්, එය පෙරදාතම් විය යුතු බවටත් ඉල්ලීමක් ඉදිරිපත් වී ඇත. එය නැවත සලකා බලා 2005.07.28 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණ හා 2006.08.02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණ අනුව 2000.04.26 වැනි දිනට ලබා දී තිබූ පිරිස් නිලධාරී තනතුර 1997.01.01 දිනට පෙරදාතම කරන ලදී.

මෙහිදී මූලිකව සලකා බැලිය යුතු කරුණක් වූයේ සේවායෝජක මෙසේ අසාධාරණයන්ට ලක්වූවන්ට ලබාදුන් සහන පිළිගන්නේ ද නැද්ද යන්නයි. මෙය අමාත්‍යාංශය විසින් පත් කළ විශේෂ කමිටුවක් මගින් තීරණය කර ඇත. සියලු කාරණා සළකා බලා තීරණය කර ඇත. වගඋත්තරකරු සේවායෝජක වෙනුවෙන් ද මෙම කමිටුවල නියෝජනයක් සිදු ව ඇත. ඒ තීරණයන් ප්‍රකාරව කේ. ප්‍රේමරත්න මහතාට පෙරදාතම් කර තනතුරු පිරිනමා ඇත. හිඟ වැටුප් ද ගෙවා ඇත. එම නිසා නිශ්චිත ප්‍රතික්ෂේප කිරීමක් සේවායෝජක කර නැති අතර පසුව එසේ ප්‍රතික්ෂේප කිරීමෙන් ප්‍රතිබන්ධනය (Estopcl) වී ඇත.

එම තනතුරුවල හිඟ වැටුප් පිරි නමා ඇත්තේ හිමිවිය යුතු නිසාය. කාලවකවානු පෙරදාතම් කර ඇත්තේ ඒ නියමිත දිනට ඒ අදළ තනතුරු ලැබිය යුතු නිසාය. අසාධාරණයක් සිදු නොවී නියමිත පරිදි තනතුරු ලැබුණා නම් කේ. ප්‍රේමරත්න මහතාට ඒ දිනයන්ට තනතුරු ලැබිය යුතුය. පෙරදාතම් කර තනතුරු පිරිනැමීමේ අදහස එයයි.

එසේම එසේ පෙරදාතම් කළ දින සිට එකී තනතුරේ සේවය කළ බවට සැළකෙයි. ඒ අනුව බැලූ බැල්මට කේ. ප්‍රේමරත්න මහතාව,

K4 වටුප් පරිමාණයේ 1989.10.03 සිට

K3 වැටුප් පරිමාණයේ 1997.01.01 දින සිට ද

වන පරිදි පෙරදාතම් කිරීම මත ඒ ඒ වර්ෂයට අනුව සේවා කාලය ගණනය කළ යුතු බව ඉල්ලුම්කරුගේ ස්ථාවරයයි. එකී ස්ථාවරය අනුව,

K4 වැටුප් පරිමාණයේ වසර 7ක් ද,

K3 වැටුප් පරිමාණයේ වසර 8ක් වශයෙන් වර්ෂ 2005.07.28 වැනි දින විට K4 හා K3 වැටුප් පරිමාණයන්ගේ වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව ඉල්ලුම්කරු වැඩිදුරටත් දරන ස්ථාවරයයි.

මෙහිදී විශේෂයෙන්ම විසඳිය යුතුව ඇත්තේ මෙම ඉල්ලුම්කරුගේ ස්ථාවරයෙන් වගඋත්තරකාර ආයතනයේ උසස්වීමේ පටිපාටිය අනුව K2 වැටුප් පරිමාණය ලබා දීම සඳහා අදළ කර ගත හැකිද යන්නයි.

ඒ අනුව මෙහි සඳහන් වැදගත්ම වචනය සක්‍රීය සේවය යන්නයි. Active Service යනු එහි ඉංග්‍රීසි වචනයයි. එහි නිර්වචනය ක්‍රියාකාරී සේවාව යන්නයි. මෙහි සක්‍රීය සේවය යන්නට නිර්වචනයක් වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් නොකරයි. නමුත් ඔවුන් වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සාක්ෂිකාරිය කේ. ප්‍රේමරත්න මහතාට අදළව දරන්නේ මෙවන් ස්ථාවරයකි. සාක්ෂි සටහන් 2018.02.22 පිටුව 9 හා 10.

ප්‍ර. : ඉල්ලුම්කරුට තමන් K2 වැටුප් තලය 2005 වර්ෂයේ දී හිමි වීමට තිබුනා ද ?

උ : අවුරුදු 8ක සක්‍රීය සේවා කාලය යන්න 2005ට සම්පූර්ණ වෙනවා.

ප්‍ර : වසර 8ක කාලය සේවා කාලය සම්පූර්ණ කිරීම නිසා 2005.01.01 වන විට ඉල්ලුම්කරුට K2 ශ්‍රේණියේ වැටුප් තලය හිමිව තිබුණා ?

උ : 1997.01.01 වන දින ගත් කළ 2005ට අවුරුදු 8 සම්පූර්ණ වෙනවා. ඒක මං පිළිගන්නවා. නමුත් මානව සම්පත් ක්ෂේත්‍රයට අදළව අවුරුදු 12ක සේවා කාලය යන්න අවුරුදු 12ක් 2000.04.26 වන දින සිට සම්පූර්ණ වෙනවා කියන එක පිළිගන්නේ නෑ.

ප්‍ර : කොහේද තියෙන්නේ මානව සම්පත අංශයේම පූර්ණව අවුරදු 12ක සක්‍රීය සේවයක් සම්පූර්ණ කරන්න ඕනෑ කියලා.

උ : කොහේවත් නෑ සක්‍රීය සේවය කියන එක තුළ මම අදහස් කරන්නේ අදළ Field එක අනුව සක්‍රීය සේවය කියන එක.

ප්‍ර : මහත්මියගේ අදහස/හැඟෙන දේ තමයි ඒ තියෙන්නේ

උ : ඔව්

ප්‍ර : නමුත් කොතනකවත් ඔය මහත්මිය පෙන්වපු ලේඛනවල මානව සම්පත් අංශයේම සක්‍රීය සේවයක් පූර්ණව වසර 12ක් සම්පූර්ණව ඇත්තේ නැහැ නේද ?

උ : ඇත්තේ නැහැ. නමුත් තේරුම් ගත්ත විදිහට මම කියනවා මෙම ලේඛනයට අදළ ක්ෂේත්‍ර වර්ගීකරණය කරලා තියෙන්නේ එකී ක්ෂේත්‍ර සක්‍රීය සේවා කාලය ගණන් ගත්ත නිසා.

ප්‍ර : නමුත් මම මහත්මියට යෝජනා කරන්නේ පැහැදිලි K2 ශ්‍රේණිය ලබාදීම සඳහා එම සේවය කරපු එම අංශයේම සක්‍රීය සේවයක් අවශ්‍ය නොවන බව ?

උ : මම කියන්නේ අවශ්‍යයි කියලා

ප්‍ර : K2 ශ්‍රේණිය ලැබීමට 2005.01.01 දිනය වන විට ඉල්ලුම්කරුට නීත්‍යානුකූල හිමිකම තිබුණා කියලා මම යෝජනා කරනවා.

උ : අවුරුදු 08ක සේවා කාලය සම්පූර්ණ කරන නමුත් මානව සම්පත් අංශයේ අවුරුදු 12ක් කියන එක අයදුම්කරු සම්පූර්ණ නොකිරීම මත මම කියනවා එම සුදුසුකම ඔහුට නැහැ කියලා

ප්‍ර : තවදුරටත් මම යෝජනා කරනවා එවැනි එක් අංශයක පමණක් සක්‍රීය සේවය කර තිබීම ඔය K2 ශ්‍රේණිය ලබා දීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් නොවන බව.

උ : මම එය පිළිගන්නේ නෑ

ප්‍ර : ඉල්ලුම්කරු දිගින් දිගටම ආයතනයෙන් K2 ලබා දෙනවා කියලා විවිධ අවස්ථාවලදී ඉල්ලීම් කළා කියලා මහත්මිය දන්නවා ද ?

උ : ඔව්

මූලික වශයෙන් වගඋත්තරකරු ඉල්ලුම්කරුගේ සක්‍රීය සේවය (වසර 8ක් සම්පූර්ණවීම) පිළිගනී. ඉදිරිපත්ව ඇති ඒ5 ලේඛනය අනුව සාක්ෂිකාරිය ප්‍රකාශ කරන ආකාරයට එකම ක්ෂේත්‍රයක (අංශයක) සක්‍රීය සේවයක් පැවතිය යුතු බවට ලේඛනයක්/සාක්ෂියක් ද වගඋත්තරකරු ඉදිරිපත් නොකරයි. එය හුදු සාක්ෂිකාරිය ප්‍රකාශ කරන පරිදි ඇයට හැගෙන ලෙස ප්‍රකාශ කිරිමක් පමණි. අඩුම තරමින් කේ. ප්‍රේමරත්න මහතා මේ කාරණය සම්බන්ධ අමාත්‍යාංශයේ විවිධ නිලධාරීන්ට ලියා ඇති ලිපි ගණනාව අතරින් එකදු ලිපියකට හෝ පිළිතුරක් ලෙස හෝ මේ කාරණා දක්වා නොමැති අතර මෙකී කාරණය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා, සාමාන්‍යාධිකාරීතුමා, අතිරේක සාමාන්‍යාධිකාරිතුමා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතුමා (පිරිස්) යන නිලධාරීන්ට යවනු ලැබූ කිසිදු ලිපියකට පිළිතුරු ද එවා නැත. (ඒ 6, ඒ7, ඒ8) මෙසේ දැඩි ස්ථාවර පදනමක් නීතිමය තත්ත්වයක් වූයේ නම් ඒ බව අඩුම තරමින් දන්වා සිටීමට තිබුණි. ඒ අනුව මෙවැනි සැබෑ තත්ත්වයක් ලංකා විදුලිබල මණ්ඩලය තුළ පැවතියේ දැයි සැක සහිතය.

එම සැකය තවදුරටත් වඩාත් තහවුරු වන්නේ ඉල්ලුම්කාර කේ. ප්‍රේමරත්න මහතා වැනිම දේශපාලන පළිගැනීම් කමිටුවලින් තිරණය දෙනු ලැබූ පුද්ගලයන්ට සළකනු ලැබූ ආකාරයට අවධානය යොමු කිරීමෙනි.

මේ සම්බන්ධව කරුණු දක්වන පැමිණිලිකාර කේ. ප්‍රේමරත්න මහතා, තම සේවයට සමාන පත්වීම් ලබා ඒ ආකාරයටම උසස්වීම් ලැබූ 1999.01.01 දින සිට මානව සම්පත් නිලධාරී තනතුරේ පිහිටුවා 2007.03.02 වැනි දින සිට K2 ශ්‍රේණියේ (වැටුප් පරිමාණයේ) පිහිටුවා සියලු වැටුප් හා හිඟ දීමනා හා සියලු ව්‍යවස්ථාපිත හිමිකම්

ගෙවූ කරුණාදස ගමගේ මහතාගේ සේවා තොරතුරු ඉදිරිපත් කර ඇත. (ඒ 12, ඒ13, ඒ14, ඒ15, ඒ16) ඒ අනුව ගමගේ මහතාද සේවාව අරඹන්නේ ලිපිකරුවෙකු ලෙස 1971.01.01 දින සිට ය. පාරිභෝගික අධ්‍යාපන සහකාර, පාලන නිලධාරී හා මානව සම්පත් නිලධාරී ලෙස උසස්වීම් ලත් කරුණාදස ගමගේ මහතාට වසර 08ක සේවා කාලයක් සපුරන අවස්ථාවේදී K2 ශ්‍රේණියේ ( වැටුප් පරිමාණයේ) උසස්වීම් ලබා දී ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ අංක AGM/(D4)/C8L/HR/ECL/16m 2008.09.22 ලිපිය අනුවය (A15)

ඒ15 ලිපියේ සඳහන් පරිදි K2 වැටුප් පරිමාණයට අදාළ වැටුප් හා සියලු දීමනා කරුණාදස ගමගේ මහතාට ගෙවා ඇත. නමුදු ඊට ප්‍රථම කරුණාදස ගමගේ මහතාට පාලන සහකාර, පාලන නිලධාරී, මානව සම්පත් නිලධාරී තනතුරුවලට පත් කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් නිකුත් කරන ලද අංක PB/Po/(E)/A1/20 හා 1996 මැයි මස 24 දිනැති ලිපියේ (ඒ13) දෙවන ඡේදයට අනුව හිඟ වැටුප් කිසිවක් ගෙවා නැත. නමුත් ඒ මහතා සේම පළිගැනීමේ කමිටුවට අභියාචනා ඉදිරිපත් කරන ලද පැමිණිලිකාර කේ. ප්‍රේමරත්න මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ගේ අංක PB/PO(E) A/1/sm 2000.04.20 වැනි දිනැති ලිපිය අනුව හිඟ වැටුප් සහිතව ඒ ඒ තනතුරුවල පිහිටුවා ඇත. (A2A) නමුදු K2 වැටුප් පරිමාණය ලබා දීමේදී කරුණාදස ගමගේ මහතාට පමණක් ලබා දුනි. මණ්ඩලයේ එකම සේවාවක සිට එකම ආකාරයට උසස්වීම් ලැබූ නිලධාරීන්ට දෙයාකාරයට කටයුතු කර ඇති බව මනාව පැහැදිලි වේ. (ඒ16) මෙසේ නිලධාරීන් දෙදෙනකුට දෙයාකාරයකට කටයුතු කිරීම තුළින් ලංකා විදුලිබල මණ්ඩලය හිතා මතාම මෙම ආරවුල නිර්මාණය කර ඇති බව තහවුරු වේ.

තවද දේශපාලන පිළිගැනීම්වලට ලක් වූ ලිපිකරු ජේ. ගුණවර්ධන මහතා 1975.03.02 වැනි දින III වන පන්තියේ ලිපිකරු තනතුරට පත් වී ඇති අතර 1981.02.02 වැනි දින ධූරය හැර ගොස් ඇත. දේශපාලන හේතූන් මත 1977 මැතිවරණයෙන් පසු සහ 1980 වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වූවන්ට සහන සැළසීම සඳහා වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති අංශයේ අභියාචනා විභාග කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශය සම්බන්ධව 1995.09.06 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹ ඇති තීරණවලට අනුව 1995.11.01 දින සිට ගුණවර්ධන මහතා නැවත සේවයේ පිහිටුවා ඇත. (ඒ 19) ලිපිකරු ගුණවර්ධන මහතා 1981.02.02 වැනි දින සිට 1995.11.01 දක්වා ධූරය හැර ගොස් සිටි අතර හිඟ වැටුප් ගෙවීම තුළින් එම කාලය සක්‍රීය සේවාවක් සේ සළකා සියලු උසස්වීම් වැටුප් වැඩිවීම් හා සියලු වරප්‍රසාද ලබා දී ඇත. (ඒ 20) ඒ මහතා 2013.02.06 වැනි දින මණ්ඩලීය සේවාවෙන් විශ්‍රාම ගත් අතර 1975.03.02 වැනි දින සිට විශ්‍රාම ගිය 2013.02.06 දක්වා වූ කාලය සක්‍රීය සේවා කාලයක් ලෙස සළකා ඔහුගේ සේවා කාලය අවුරුදු 38ක් ලෙස ගණනය කර ධූරය හැර ගිය අවුරුදු 14ක සේවා කාලය සමඟ හිඟ වැටුප් ගෙවීම පදනම් කර ගෙන විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ගෙවා ඇත. (ඒ 21) විශ්‍රාම වැටුප ද ඒ අනුව ගෙවීමට කටයුතු කර ඇත.

ඒ12 සිට ඒ21 දක්වා ලේඛන මගින් මේ බව සනාථ වේ. මේ අනුව ලංකා විදුලිබල මණ්ඩලය කේ. ප්‍රේමරත්න මහතාට වෙනස් ආකාරයකට සළකා ඇති බවත් ඔවුන් ගත් ස්ථාවරය නිවැරදි නොවන බවත් පෙනී යයි.

එසේම කේ. ප්‍රේමරත්න මහතාට උසස්වීම්වලට අදාළ 2005.01.01 දිනට හිමි වැටුප් පරිමානය ලබා නොදීම හේතුවෙන් ඒ මහතාට 2005.01.01 දින සිට විශ්‍රාම ගන්වන ලද 2010.02.22 දින දක්වා උපරිම වේතනය නොලැබ සේවය කිරීමට සිදු වී ඇති බව මානව සම්පත් නිලධාරී (කලාප 01) ගේ අංක AGM(R1) HRO/G2/A1527 හා 2006.11.17 දිනැති (ඒ4) ලිපියෙන් පෙනී යයි. එසේම එකී ලිපියේ පිටපතක් ගණකාධිකාරී (උ. ප. ම.) වෙත 2006.06.02 දින සිට හිඟ වැටුප් ගෙවීම සඳහා යොමු කිරීමෙන්ම මෙකී අසාධාරණය ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරී විසින් ද පිළිගෙන ඇති බව පෙනී යයි.

එසේ නමුදු කේ. ප්‍රේමරත්න මහතා මෙකී ආරවුල සම්බන්ධයෙන් අනුරාධපුර කම්කරු කාර්යාලයට පැමිණිලි කිරීමෙන් පසුවද වගඋත්තරකාර මණ්ඩලය ආරවුල විසඳීමට සාධනීය මැදිහත්වීමක් සිදු නොකළ බව සාක්ෂි විශ්ලේෂණය කිරිමේදී පෙනී යයි. එසේම නියෝජ්‍ය කම්කරු කොමසාරිස්ගේ (කාර්මික සම්බන්ධතා) නියෝගය ලංකා විදුලිබල මණ්ඩලයට දන්වා යැවීමෙන් පසුව ද එකී නියෝගය අතිරේක සාමාන්‍යාධිකාරී විසින් සටහන් තබා පහළ නිලධාරීන්ට යොමු කරනු ලැබුව ද එකී නිර්දේශ ක්‍රියාත්මක වී නැත.

මේ අනුව පෙනී යන්නේ ලංකා විදුලිබල මණ්ඩලය මෙකී ආරවුල විසඳීම සම්බන්ධව උදාසීන පිළිවෙතක් අනුගමනය කර ඇති බවයි.

ඉදිරිපත් ව ඇති ලේඛන ද සාක්ෂි ද සමථයක් ලෙස සම්පිණ්ඩනය කර සළකා බැලීම කළේ ය.

එහිදී Ceylon Estate Staff vs supted 08 Mramore Estate

The President of a labour tribunal should make a proper evaluation and consideration of the Totaly of the evidence before arriving of conclusion වැදගත් වේ. එසේම

Lewis Brown 7 co' ltd Đ Percy Nelson Chistoper Periyapperuma 81 CLW 30.

That the order of the tribunal is not just and equitable order of it is made without examination and consideration of all relevant evidence adduced the inquiry.

ඒ අනුව සුදුසුකම් සපුරා තිබියදී K2 වැටුප් පරිමාණය ලබා නොදීමෙන් ඉල්ලුම්කාර කේ. ප්‍රේමරත්න මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවට තීරණය කරමි. සැමවිටම

That the order of the tribunal is not just and equitable order of it is made without examination and consideration of all relevant evidence adduced the inquiry.

ඒ අනුව සුදුසුකම් සපුරා තිබියදී K2 වැටුප් පරිමාණය ලබා නොදීමෙන් ඉල්ලුම්කාර කේ. ප්‍රේමරත්න මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවට තීරණය කරමි. සැමවිටම සාධාරණ හ යුක්ති සහගත තීරණ ලබාදීමට බැඳී සිටින කාර්මික අධිකරණය හා බේරුම්කරණ ක්‍රියාවලියේ දී මෙම අසාධාරණය නිවැරදි කළ යුතු බව තීරණය කරමි.

ඒ අනුව 2005.01.01 දින සිට K2 ශ්‍රේණියට පත් නොකිරීම නිසා කේ. ප්‍රේමරත්න මහතාට,

01. අහිමි වී ඇති වැටුප් රු. 563,389/-

02. අහිමි වී ඇති ප්‍රසාද දීමනා රු. 57,645/-

03. අහිමි වී ඇති දිරිදීමනා රු. 57.645/-

04. අහිමි වී ඇති නිවාඩු දින වැටුප් රු. 6,275/-

05. අහිමි වී ඇති විශ්‍රාම පාරිතෝෂිතය රු. 438,945/-

06. අහිමි වී ඇති විශ්‍රාම වැටුප් රු. 310,982/-

හිමි විය යුතු බවට තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි. මෙය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

සුනෙත් ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2019 මැයි මස 21 වැනි දින.

10- 680

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.